| | |
|---|---|
| **මහ/මහාමායා බාලිකා විදුහල**<br>**MAHAMAYA GIRLS' COLLEGE** | |
| දෙවන වාර පරීක්ෂණය - 2022 | **ශ්‍රේණිය - 8** |
| **බුද්ධ ධර්මය** | **පැය 2** |

**විභාග අංකය / Index No** ..................................

## 1 කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර ලකුණු කරන්න.

01) පංචවරය ඉල්ලා සිටි භික්ෂුව වන්නේ,

1) ආනන්ද හිමි
2) කාළුදායි හිමි
3) සැරියුත් හිමි
4) දෙව්දත් හිමි

02) සොණදණ්ඩ බමුණා බුදුන් වහන්සේ පිළිබඳව සඳහන් කරද්දී උක්තානමුඛය යනුවෙන් සඳහන් කිරීමෙන් අදහස් වන්නේ,

1) සතුටු සාමීචි කථා ඇත්තෙක් බව යි
2) විවෘත කථාබහ ඇති බව යි
3) පළමුව කථා කරන්නෙක් බව යි
4) කනට සුව එලවන කථාබහ ඇත්තෙක් බව යි

03) "ගුරු බස සැබෑමය" යන කවිය ඇතුලත් කෘතිය වනුයේ,

1) කාව්‍යශේඛරය
2) බුදුගුණාලංකාරය
3) සිරිත් මල්දම
4) ලෝවැඩ සඟරාවය

04) ධර්මය මනාව ප්‍රගුණ කරන්නාට දිගු කලක් ගත නොවී ඒ මොහොතේදීම යහපත උදාකර ගත හැක යන අරුත් දෙන දහම් ගුණය වනුයේ,

1) සන්දිට්ඨිකෝ
2) ඒහිපස්සිකෝ
3) ඕපනයිකෝ
4) අකාලිකෝ

05) "කිරිකඩ හේල" නම් වස්ත්‍රයක් යොදා ගනුයේ,

1) අවමගුල්
2) ගෘහ ප්‍රවේශ
3) අකුරු කියවීමේ
4) විවාහ මංගල්‍ය චාරිත්‍ර ඉටු කිරීමේදී ය

06) බුදුගුණ භාවනාවේ ප්‍රතිඵලයක් නො වන්නේ,

1) පාපයට ලැජ්ජා බිය ඇති වීම
2) නපුරු සිහින නොදැකීම
3) සිත සමාධිගත වීම
4) සසර ගමන දික්වීම

07) "අප දෙදෙනාගෙන් යමෙකු පළමුව විමුක්තිය ලද හොත් ඒ බව අනෙකාට ද දැන්විය යුතුය" යන සංවාදය ඇතිවූයේ,

1) කෝලිත - උපතිස්ස
2) චන්න - කාළුදායි
3) වප්ප - භද්දිය
4) උරුවෙල කාශ්‍යප - ගයා කාශ්‍යප අතරය

08) බුදුන් වහන්සේ වේදනා පරිග්ගහ සූත්‍රය දේශනා කළේ,

1) සෝණදණ්ඩ බමුණාට ය
2) තැන්බෑ ජටිලයන්ට ය
3) භද්‍රවග්ගිය භික්ෂූන්ට ය
4) දීඝනක පිරිවැජියාට ය

09) 'ධර්ම සේනාධිපති' යන තනතුරුලාභී ශ්‍රාවක භික්ෂුව වනුයේ,

1) මුගලන් හිමි
2) සැරියුත් හිමි
3) මහා කාශ්‍යප හිමි
4) පුණ්ණ හිමි

10) සම්මුඤ්ජනී හිමියන් හට පමා බවින් මිදීමට උපදෙස් දුන් මහරහතන් වහන්සේ වනුයේ,

1) රේවත හිමි
2) සුමන හිමි
3) යස හිමි
4) පුන්නජී හිමි

11) පරිමණ්ඩල යනුවෙන් අදහස් කරනුයේ,

1) පෙකනිය නොදක්වා ඇඳුම් ඇඳීම යි
2) දත් පෙන්වා සිනහ නොවීම යි
3) බොලට දක්වා දිගට ඇඳුම් ඇඳීම යි
4) හාත්පසින් වට කොට ඇඳීම හා පෙරවීම යි

12) නැති අයිතියක් කියා නඩු මගින් ඉඩම් අයිති කර ගැනීම අයත් වන්නේ,

1) සොරකමට ය
2) මුසාවාදයට ය
3) මිච්ඡා ආජීවයට ය
4) සම්මා ආජීවයට ය

13) "ඒකං ධම්මං අතීතස්ස - මුසාවාදිස්ස ජන්තුනෝ" ගාථාව අයත් වන්නේ,

1) යමක
2) අප්පමාද
3) පණ්ඩිත
4) ලෝක වග්ගයට ය

14) බුදුන් වහන්සේ සිඟාලකට සිඟාලෝවාද සූත්‍රය දේශනා කරනු ලැබුවේ,

1) උදෑසන ජලයට බැසීමේ ආදීනව කියා දීමට ය
2) සදිසා නමස්කාරය ඵලක් නැති බව කියා දීමට ය
3) ආර්ය විනයෙහි සදිසා සංග්‍රහය සිදුවන ආකාරය කියා දීමට ය
4) ඉහත කිසිදු පිළිතුරක් නොවේ.

15) “සම්බුද්ධ ශාසනයේ අඩක් පමණ පවතින්නේ කළ්‍යාණ මිත්‍ර ආශ්‍රය නිසා නේද?” යනුවෙන් බුදුන් වහන්සේගෙන් විමසා සිටියේ,

1) දේවදත්ත
2) චුල්ලතිස්ස
3) රේවත
4) ආනන්ද හිමියන් ය

16) බෝසතුන්ගේ ප්‍රඥා මහිමය විදහා පෙන්වන ජාතක කථාවකි,

1) කුස
2) උම්මග්ග
3) මාතු පෝෂක
4) තිත්තිර ජාතකය

17) නිගණ්ඨනාතපුත්ත තුමාගේ ප්‍රධාන දායකයා වූයේ,

1) සකුලදායි
2) සේල
3) උපාලි
4) ධනංජය

18) දම්සක් පැවතුම් සූත්‍රයට අනුව දුක,

1) සය වැදෑරුම් ය
2) නව වැදෑරුම් ය
3) දස වැදෑරුම් ය
4) අට වැදෑරුම් ය

19) මානසිකව කරන රැස් කිරීම්,

1) විඤ්ඤාණය යි
2) වේදනා යි
3) සඤ්ඤාව යි
4) සංකාරය යි

20) මතු උපතක් නැත යන උච්ඡේද දෘෂ්ටිය අයත් වන්නේ,

1) කාම තණ්හාවට ය
2) භව තන්හාවට ය
3) විභව තන්හාවට ය
4) ඉහත කිසිවකටත් නොවේ

| | |
|---|---|
| **මහ/මහාමායා බාලිකා විදුහල**<br>**MAHAMAYA GIRLS' COLLEGE** | |
| දෙවන වාර පරීක්ෂණය - 2022 | **ශ්‍රේණිය - 8** |
| **බුද්ධ ධර්මය II** | |

**විභාග අංකය / Index No ................................**

පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න

නිවැරදි පිළිතුර යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න

01.

i. අශෝක අධිරාජ්‍යයා බෞද්ධයෙකු බවට පත්වූයේ ............................................. සාමණේරයන් වහන්සේ කෙරෙහි පැහැදීමෙනි.

ii. කාව්‍යශේඛරය රචනා කරනු ලැබූවේ ...................................................... හිමියන් විසිනි.

iii. උපයා ගත් ධනය ආරක්ෂා කිරීම ................................................ යුතුකමකි.

iv. .............................................නම් දාර්ශනිකයා බුදු දහම අගය කරන්නේ එමගින් කිසිවෙක් පීඩාවට පත් නොකරන නිසාය.

v. ආයුෂ ගෙවී යෑමෙන් මරණයට පත්වීම ............................................. මරණයයි.

vi. දුකට මූලික හේතුව ............................................. යි.

vii. තම ආගම අදහන අතර, අන් ආගම දහමට හිරිහැර නොකිරීම හා ගරු කිරීම .................................. ලක්ෂණයයි.

viii. අහිංසකගේ (අංගුලිමාල) මව ................................................... බැමිණියයි.

ix. ඍද්ධිමත් භික්ෂූන් අතර අග තනතුර හිමිවූයේ ................................................... තෙරුන් වහන්සේටය.

02.

i. "ඉඳ ඉඳ එක වෙහෙර" යන කවිය ඇතුළත් කෘතිය සහ එහි කතුවරයා ලියන්න. (ල 2)

ii. දේවදත්ත හිමි ඉදිරිපත් කළ පංචවරයෙන් තුනක් ලියන්න. (ල 3)

iii. පංචවරය පිළිබඳව ගැටලුව විසඳූ ආකාරයෙන් බුදුන් වහන්සේගේ ගැටලු විසඳීමේ ඥානාන්විත ආකාරය ප්‍රකට වන ආකාරය පැහැදිලි කරන්න. (ල 5)

03.

i. තණ්හාවේ ප්‍රභේද 2ක් නම් කරන්න (ල 2)

ii. ඒවායින් එකක් කෙටියෙන් හඳුන්වන්න (ල 3)

iii. තණ්හාව දුකට හේතුවන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න (ල 5)

04

i. බුදුගුණ මෙනෙහි කොට සිත පහදවාගෙන මරණින් මතු දෙව්ලොව උපන් දෙදෙනෙකු නම් කරන්න. (ල 2)
ii. බුදුගුණ භාවනාවේ ආනිශංස 3ක් ලියන්න. (ල 3)
iii. බුද්ධානුස්සති භාවනාව වඩන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල 5)

05.

i. සීලය හඳුන්වන්න. (ල 2)
ii. ගිහියන් රකින සිල් වර්ග 3ක් ලියන්න. (ල 3)
iii. සීල සමාදානයේ වැදගත්කම කියවෙන වාක්‍යය 5ක් ලියන්න. (ල 5)

06.

i. අට වැදෑරුම් දුකෙන් දෙකක් ලියන්න. (ල 2)
ii. පංචස්කන්ධයෙන් 3ක් ලියන්න. (ල 3)
iii. තණ්හාව සමාජ ගැටළු ඇතිවීමට හේතුවන ආකාරය දැක්වෙන ඡේදයක් ලියන්න. (ල 5)

07. පහත සඳහන් මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න (ල 10)

i. ධම්ම පදය
ii. දත් වැළඳීම පිළිබඳ සේඛියා
iii. දුක
iv. දණ්ඩක ප්‍රශ්නය